# සී/ස සෞඛ්‍ය දෙපාර්තමේන්තුවේ සමුපකාර සකසුරුවම්කම සහ ණය ගනුදෙනු පිළිබඳ සමිතියේ 2026.03.28 වන දින පැවැත්වීමට නියමිත වූ 61 සංවත්සර මහා සභාව හා නිලවරණය තාවකාලිකව අවලංගු කරන බව සාමාජිකත්වය වෙත දැනුම් දීම

සමුපකාර සංවර්ධන දෙපාර්තමේන්තුවේ ස.සං.දෙ/පා/1/25 අංක හා 2026.03.17 දිනැති චක්‍රලේඛ අංක 04/2026 මඟින් ලබා දී ඇති උපදෙස් පරිදි,

මැද පෙරදිග කලාපයේ නිර්මාණය වී ඇති යුද ගැටුම් හේතුවෙන් ඉදිරියේදී ඉන්ධන සපයා ගැනීමෙ අවිනිශ්චිත තත්වයක් ඇතිවුවහොත් එයට මුහුණ දීම සඳහා දැනට පවතින ඉන්ධන සංචිත අරපිරිමැස්මෙන් යුතුව භාවිතා කල යුතු බවට 2026.03.17 දිනැති රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ අංක 09/2026 අනුව දැනුවත් කර ඇති පරිදි මෙම තත්වය සමනය වන තුරු සියලු සමුපකාර සමිති/සංගම්හි නිලවරණ, මහසභා රැස්වීම්, උත්සව හා සම්මන්ත්‍රණ ආදිය පැවැත්වීම තාවකාලිකව අවලංගු කරන බව සමුපකාර සංවර්ධන දෙපාර්තමේන්තුව විසින් දැනුම් දී ඇත.

එහෙයින් **2026.03.28 දින මහනුවර, පොල්ගොල්ල ජාතික සමුපකාර සංවර්ධන ආයතන පරිශ්‍රයේදී පෙ.ව. 9.00 ට** පැවැත්වීමට නියමිත වූ මෙම සමිතියේ 61 වන සංවත්සර මහා සභාව හා නිලවරණය නැවත දැනුම්දෙන තුරු තාවකාලිකව අවලංගු කරන බව සියලු සාමාජිකත්වය වෙත මින් දන්වා සිටිමු.

මෙම 61 වන සංවත්සර මහසභා රැස්වීම වෙනුවෙන් නිකුත් කර ඇති න්‍යාය පත්‍රය ඇතුළත් වාර්තා පොත හා නිලවරණය සඳහා පිළිගත් අපේක්ෂකයන්ගේ තරග අංක ඒ ආකාරයෙන්ම ඉදිරි දිනකදී මහනුවර, පොල්ගොල්ල, ජාතික සමුපකාර සංවර්ධන ආයතනයේ මහින්ද රාජපක්ෂ ශ්‍රවණාගාරය ඇතුළු එම පරිශ්‍රයේදී පැවැත්වීමට නියමිත 61 වන සංවත්සර මහ සභාව හා නිලවරණය සඳහා ද වලංගු වන බව වැඩි දුරටත් දන්වා සිටිමු.

**ඩබ්ලිව්.ඒ.ඩී. විමලරත්න**

**ලේකම්**

**සී/ස සෞඛ්‍ය දෙපාර්තමේන්තුවේ සමුපකාර සකසුරුවම්කම සහ ණය ගනුදෙනු පිළිබඳ සමිතිය.**

**37/36, පන්සල පාර, කොළඹ 10**

2026.03.25